Att: Dilham

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | 7/13/P/73 (V4) | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2018.04.20 |

25 APR 2018

චක්‍රලේඛ අංක - 06/ 2018

සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය /සහකාර කොමසාරිස්වරුන් හා
සියලුමගොවිජන සේවා කාරක සභා විධායක ලේකම්වරුන් වෙත,

**2015/2017 කුඹුරු ඉඩම් නාම ලේඛන ප්‍රතිශෝධන වැඩසටහන යටතේ හඳුනාගත් පුරන් කුඹුරුවලට අදාල තොරතුරු ඇතුලත් ලේඛනයක් පිළියෙල කිරීම**

2015/2017 වර්ෂවල ක්‍රියාත්මක වූ දීප ව්‍යාප්ත කුඹුරු නාම ලේඛන ප්‍රතිශෝධන වැඩසටහන යටතේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් පිළියෙළ කරන ලද කුඹුරු නාම ලේඛනවල පුරන් කුඹුරු ලෙස හඳුනාගත් කුඹුරු A,B, හා C යනුවෙන් ග්‍රා.නි. කොට්ඨාශ මට්ටමින් වර්ගීකරණය කිරීමට කෘ.ප.නි.ස.වරුන් විසින් මේවනවිට කටයුතු කර ඇති අතර, ඊට අදාළ තොරතුරු පහත සඳහන් වේ.

A - නැවත වරක් වී වගාව සඳහා යොමුකල යුතු පුරන් කුඹුරු .

B - නැවත වරක් වී වගා කිරීමට අපහසු වුව ද, කෙටිකාලීන බෝග (අර්ධ වාර්ෂික) කන්න බෝග හෝ මිරිදිය මසුන් ආදිය (බහුවාර්ෂික / ස්ථිර වගාවන් නොවන) සඳහා යොමු කලයුතු පුරන් කුඹුරු.

C - ඉහත A හා B හි සඳහන් භාවිතයන් සඳහා යොමුකල නොහැකි බැවින්, කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා නිර්දේශ කරන පුරන් කුඹුරු.

ඒ අනුව සෑම ගොවිජන සේවා කාරක සභාවක් විසින්ම පුරන් කුඹුරු පිළිබ තොරතුරු ඇමුණුම - 1 ආකෘතිය අනුව පිළියෙල කොට පවත්වාගෙන යායුතු අතර, යම් දිනක එම ඉඩමේ තත්වයේ වෙනසක් සිදුවුනි නම් (උදා:- B තත්වයේ සිට A තත්වයට පත් කරන ලද) එම වෙනස හා වෙනස සිදු වූ දිනය ඊට අදාල තොරතුරු ඇතුලත් සටහනක් ද සමගින් එම ලේඛණයේම සඳහන් කල යුතුය.

එසේම මෙම ලේඛණය ගොවිජන සේවා කාරක සභාව මඟින් පවත්වාගෙන යායුතු ලේඛණයක් ලෙස එහි විධායක ලේකම්ගේ අධීක්ෂණය හා ආරක්ෂාව යටතේ තබා ගත යුතු අතර, එම ලේඛණයේ යම් සටහනක් වෙනස් කරන්නේ නම්, එය රතු පැනින් සිදුකොට අනු අත්සන් යෙදීමට ගොවිජන සේවා කාරක සභාවේ විධායක ලේකම් කටයුතු කල යුතු වේ.එසේම මේ වනවිට කෘ.ප.නි.ස. වරුන් විසින් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබා දෙන ලද සම්පූර්ණ කරන ලද DAD/PLR/1 ආකෘති අතුරින් පුරන් කුඹුරු වලට අදාල ආකෘති වල මුල් පිටුවේ දකුණු පස උඩ කෙළවරේ විශාල අකුරින් ඉහත වර්ගීකරණයට අදාල අක්ෂරය (A,B හෝ C) සටහන් කලයුතු අතර, කුඹුරු නාම ලේඛණ කෙටුම්පතේ එම ඉඩමට අදාළ සටහන් තීරුවේ වර්ගීකරණයට අදාල ඉහත අකුර සටහන් කල යුතුය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, அ. பெ. 537, கொழும்பு 07.
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT, NO. 42, SIR MARCUS FERNANDO MAWATHA, P. O. BOX 537, COLOMBO 07.
දුරකථන/தொலைபேசிகள்/Telephones :

පොදු කාර්යාලය / பொது அலுவலகம் / General Office – 2694231, 2694232, 2694233, 2694234

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம் / Commissioner General of Agrarian Development – 2691060

ෆැක්ස් / தொலை நகல் / Fax – 2691843, 2674481

E-mail : commissionerdad@yahoo.com

විදුලි පණිවුඩ / தந்தி / Telegram – ගොවිසේවා / கொவிசேவா / Agraservis

ඉහත සඳහන් පුරන් කුඹුරු වර්ගීකරණයේ "C" බාණ්ඩයට ඇතුලත් ඉඩම් පිළිබඳ වැඩිමනක් තොරතුරු රැස්කර ගැනීම සඳහා පහත සඳහන් උපදෙස් අනුගමනය කරන මෙන් මෙයින් උපදෙස් දෙමි.

(අ) අදාල ඉඩමේ ගොවියා, ගොවි සංවිධානය හා කෘ.ප.නි.ස. වරයා විසින් ලබා දී ඇති තොරතුරු හා නිර්දේශ මත යම් ඉඩමක් "C"බාණ්ඩයේ පුරන් කුඹුරක් ලෙස හඳුනාගෙන ඇති අවස්ථාවලදී එම තත්වය වැඩිදුරටත් සනාථ කර ගැනීම සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් කළ යුතුය.

ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන්/ගොවිජන සංවර්ධන නිලධාරීන් ගොවිජන සංවර්ධන ඉංජිනේරු සහකාර/තාක්ෂණ නිලධාරීන් කෘෂිකර්ම උපදේශක.

(ආ) ඉහත නිලධාරීන් විසින් "C"බාණ්ඩයට අයත් ඉඩම් පෞද්ගලිකවම පරීක්ෂා කොට, මෙම ඉඩම් තවදුරටත් ඉහත සඳහන් කළ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගත නොහැකි බවට ඒකමතිකව තීරණය කළ යුතු අතර, ඒ සඳහා (ඇමුණුම -2) **DAD/PLR/2018/01** ආකෘතිය යොදා ගත යුතු වේ. තාක්ෂණ නිලධාරීන් විසින් මෙම ඉඩම් පරීක්ෂා කිරීමේදී මෙම ඉඩම ඇතුලත හෝ ඉඩමට මායිම්ව හෝ යාබදව පවතින ජල මූලාශ්‍ර පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර, ස්වභාවික ඇළ මාර්ග, වාරිමාර්ග, ජල උල්පත් ආදී ජල මූලාශ්‍ර වල ආරක්ෂාව සඳහා පවත්වා ගත යුතු රක්ෂිත බිම් හා සංරක්ෂණ කලාප මෙම ඉඩම තුළ පිහිටා තිබේ නම් ඒ බැව් තම නිර්දේශයේ සටහන් කළ යුතුය.

(ඇ) එසේම අදාල ඉඩම පිළිබඳව ගොවිජන සේවා කාරක සභාවේ නිර්දේශය ඇතුලත් **DAD/PLR/2018/01** ආකෘතිය (ඇමුණුම 03) විධායක ලේකම් වරුන් විසින් දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් වෙත **2018.05.31** දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

(ඈ) අදාළ ඉඩම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් බල ප්‍රදේශයක් තුළ පිහිටා තිබේ නම්, ඉහත නිර්දේශය සම්බන්ධයෙන් අදාළ වාරිමාර්ග ඉංජිනේරුවරයාගේ එකඟතාවය ලබා ගැනීමට දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරයා විසින් ක්‍රියා කළ යුතු වේ.

(ඉ) ආකෘති අංක **DAD/PLR/2018/01** යටතේ නිර්දේශ ලබා දීමේදී පහත සඳහන් වර්ගීකරණය අනුගමනය කළ යුතු වේ.

I. මෙම ඉඩම නැවත වරක් කුඹුරු ඉඩමක් බවට පත් කිරීමට උත්සාහ කළ යුතු බව කමිටුව විසින් නිර්දේශ කරන ඉඩම්.

II. මෙම ඉඩම කුඹුරු නාම ලේඛනයෙන් ඉවත් කොට, ගොඩ ඉඩම් නාම ලේඛනයට ඇතුලත් කළ යුතු බවට නිර්දේශ කරන ඉඩම්.

උස් බිම් වගාවන්, හේන්, ගෙවතු හා ගොඩනැගිලි සහිත වෙනත් කෘෂිකාර්මික බිම් මේ යටතට ගැනේ.

III. කුඹුරු ඉඩම් නාම ලේඛනයෙන් ඉවත් කිරීමට පමණක් තීරණය කරන පුරන් කුඹුරු මේ යටතට ගැනේ.

උදාහරණ ලෙස සම්පූර්ණයෙන් කොන්ක්‍රීට් ඇතිරූ වාහන සේල්, ඉන්ධන පිරවුම්හල්, ක්‍රීඩාගාර ආදී ව්‍යාපාරික ස්ථාන ගත හැකිය.

IV. වෙනත් රාජ්‍ය ආයතනවල භාරකාරීත්වයට පැවරිය යුතු කෙත් බිම්, පහත් බිම්, අභය භූමි ආදිය මේ යටතට ගැනේ.

(ද) මෙම කටයුත්ත 2018.06.15 දිනට පෙර අවසන් කොට, DAD/PLR/2018/03 (ඇමුණුම - 4) ආකෘතියෙන් ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කිරීමට සියලුම දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් ක්‍රියා කළ යුතු අතර, යම් විශේෂ හේතුවක් මත එසේ සිදු කළ නොහැකි නම්, ඒ බැව් මා වෙත කල් ඇතිව දැනුම් දී, ඒ සඳහා අවශ්‍ය අමතර කාලය මවිසින් අනුමත කර ගත යුතු වේ.

02. මෙරටේ කෘෂිකාර්මික ඉඩම් ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා සිදු කරනු ලබන මෙම උත්සාහය සාර්ථක කර ගැනීම සඳහා ඔබ විසින් දක්වනු ලබන ඉහළ දායකත්වය අතිශයින් අගය කරමි.

ඩබ්.එම්.එම්.බී.වීරසේකර
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත්:

1. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
2. ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය
3. රාජ්‍ය ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
4. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
5. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
6. සියළුම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වරුන් වෙත
7. සියලුම පළාත් කෘෂිකර්ම ලේකම්වරුන් වෙත
8. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් වෙත
9. සියලුම පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් වෙත,
10. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත
11. සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් වෙත

ඇමුණුම - 01

## 2015/2017 කෘෂිකාර්මික ඉඩම් නාමලේඛණ ප්‍රතිශෝධන වැඩසටහනේ දී හඳුනාගත් පුරන් කුඹුරු පිළිබඳ තොරතුරු

දිස්ත්‍රික්කය : (අංකය) [ ][ ]

ගොවිජන සේවා මධ්‍යස්ථානය : (අංකය) [ ][ ]

ග්‍රා.නි. කොට්ඨාශය : (අංකය) [ ][ ][ ][ ]

| අනු අංකය | යාය අංකය | පුරන් කුඹුරු සඳහා හඳුනා ගැනීමේ අංකය | ඉඩමේ ආරම්භක තත්ත්වය A,B,C | ඉඩමට අදාල තත්ත්වයේ වෙනසක් සිදුවුයේ නම් ඊට අදාල තොරතුරු | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|
| | | | | දිනය | නව තත්ත්වය A,B,C | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

ඉහත තොරතුරු නිවැරැදි බව සහතික කරමි.

දිනය: ...........................................

විධායක ලේකම්.

නිල මුද්‍රාව.

ඇමුණුම - 02

| ආකෘති අංක : DAD/PLR/2018/01 |
|---|

| අනු අංකය: | |
|---|---|

**2015/2017 කුඹුරු ඉඩම් නාම ලේඛන ප්‍රතිශෝධන වැඩසටහනේදී හඳුනාගත් *"C"කාණ්ඩයට අයත් පුරන් කුඹුරු පිළිබඳ පරීක්ෂණ වාර්තාව.**

| කුඹුරු ඉඩම හඳුනාගැනීමේ අංකය | | | / | | | / | | | | | | /P/ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|

**ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන්/ ගොවිජන සංවර්ධන නිලධාරීන් විසින් පිරවිය යුතුය.**

1) වර්තමාන ඉඩමේ භාවිතය: ගෙවත්ත ☐ ව්‍යාපාරය හෝ කාර්යාල ☐ හේන ☐
(Land Use) (X) උස්බිම් වගාව ☐ ........................................ වෙනත් ☐
(සඳහන් කරන්න)

2) වර්තමාන ඉඩමේ ආවරණය: ගොඩනැඟිලි ☐ බහුවාර්ෂික බෝග ☐
(Land Cover) (X) කන්න බෝග ☐ කෙටිකාලීන /අර්ධ වාර්ෂික බෝග ☐ මුඩු බිම ☐
......................වෙනත් ☐

3) ස්ථිර ගොඩනැඟිලි ඉදිකර තිබේ නම්, ඒ පිළිබඳ විස්තර

| ගොඩනැඟිලි ප්‍රමාණය (දිග හා පළළ -අඩි) | භාවිතය | ඉදි කළ වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |

4) ස්ථිර (බහු වාර්ෂික) වගාවන් පවතී නම් ඒ පිළිබඳ තොරතුරු

| වගාව | ගස් සංඛ්‍යාව | වයස (දළ වශයෙන්) |
|---|---|---|
| | | |
| | | |
| | | |

I. "C"කාණ්ඩයට අයත් පුරන් කුඹුරු - වී හෝ වෙනත් අර්ධ වාර්ෂික බෝග හෝ කන්න බෝග වගා කිරීම හෝ, මිරිදිය මසුන් ඇති කිරීම ආදී කෘෂිකාර්මික කටයුතු සඳහා සුදුසු නොවන බවට හඳුනා ගත් පුරන් කුඹුරු.

II. මෙම පරීක්ෂණ වාර්තාවට, 2016/2017 කුඹුරු ඉඩම් නාමලේඛන ප්‍රතිශෝධන වැඩසටහනේදී ඉදිරිපත් වූ DAD/PLR/01 ආකෘතියේ සහතික කළ ඡායා පිටපතක් යා කළ යුතු වේ.

5) අර්ධ වාර්ෂික කන්න බෝග වගා කර තිබේ නම්, ඒ පිළිබඳ තොරතුරු

| බෝගය | වගා කරන බිම් ප්‍රමාණය ආසන්න වශයෙන් | | | කුමන වර්ෂයේ සිටද? |
|---|---|---|---|---|
| | අක්කර | රූඩ | පර්චස් | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

6) වෙනත් ඉඩම් භාවිත වෙතොත් ඒ බැව් සඳහන් කරන්න.
(උදා:වගුරු බිම්, තෙත් බිම්, පහත් බිම් ආදිය)

I. ..........................................................................................................................

II. ..........................................................................................................................

III. ..........................................................................................................................

වෙනත් විශේෂ කරුණු.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

<u>කාර්මික නිලධාරීන් හෝ ඉංජිනේරු සහකාරවරුන් විසින් පිරවිය යුතුය.</u>

7) ජල මූලාශ්‍ර

7.1. මෙම ඉඩම හා සම්බන්ධ ජල මූලාශ්‍ර පවතී ද? ඔව් ☐ නැත ☐

7.2. ජල මූලාශ්‍ර පවතී නම්, ඒ පිළිබඳ තොරතුරු

| *ජල මූලාශ්‍රය | ** පිහිටීම | ඉඩම තුල වෙන් කළ යුතු රක්ෂිත/සංරක්ෂිත බිම් සීමාව (අඩි) | රක්ෂිත/සංරක්ෂිත බිම් වෙන් කළ යුතු මායිම උ:, නැ:, දැ:, බ: ආදී ලෙස |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

7.3. ජල මූලාශ්‍ර වල ආරක්ෂාව සඳහා සිදුකරනු ලබන වෙනත් යෝජනා

(අ) ..........................................................................................................................

(ආ) ..........................................................................................................................

(ඇ) ..........................................................................................................................

* වැව්, අමුණු, ස්වභාවික ජල මාර්ග, වාරි ඇළ, දිය උල්පත් ආදී ලෙස.

** ඉඩම තුල - 1 , ඉඩමට මායිම්ව – 2 , ඉඩමට ආසන්නයේ – 3

8) විශේෂ බල ප්‍රදේශ (X)

8.1. මෙම ඉඩම වෙනත් රාජ්‍ය ආයතනයක් විසින් පාලනය කරනු ලබන,විශේෂ බල ප්‍රදේශයන් තුල පිහිටා තිබේ ද? ඔව් ☐ නැත ☐

8.2. ඔව් නම්, ඊට අදාළ තොරතුරු

(අ) පහත් බිම් ☐ (ආ) තෙත් බිම් ☐ (ඇ) අභය භූමි ☐ (ඈ) රක්ෂිත කැළෑ ☐

පරිසර වශයෙන් සංවේ දී වෙනත් ප්‍රේරණ කලාප (Buffer Zone) ☐ කුඹුරු ඉඩමකට හෝ කුඹුරු යායකට යාබද ඉඩම් ☐ වෙනත්............ (සඳහන්කරන්න) ☐

8.3. මෙම ඉඩම මහා වාරි මාර්ග / විශේෂ වාරිමාර්ග බල ප්‍රදේශයක් තුල පිහිටා තිබේද? ඔව් ☐ නැත ☐

වෙනත් විශේෂ කරුණු.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

<u>කෘෂිකර්ම උපදේශකවරයා විසින් පිරවිය යුතුය.</u>

9) මෙම ඉඩම තව දුරටත් කුඹුරක් ලෙස පවත්වාගෙන යාමට අපහසු වන කෘෂිකාර්මික හේතු සඳහන් කරන්න.

(අ)

(ආ)

(ඇ)

10) පොදු නිර්දේශය (අනවශ්‍ය ඡේද කපා හරින්න )

(අ) මෙම ඉඩම නැවත වරක් කුඹුරක් ලෙස පවත්වා ගෙන යැමට උත්සහ කල යුතුය.

(ආ) මෙම ඉඩම තවදුරටත් කුඹුරක් ලෙස පවත්වා ගෙන යැමට ප්‍රායෝගික නොවන බැවින්,ගොඩ ඉඩම් නාමලේඛණයට ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය.

(ඇ) කෘෂිකාර්මික ගොඩ ඉඩමක් ලෙස පවත්වා ගෙන යා නොහැකි බැවින්, කුඹුරු ඉඩම් නාම ලේඛණයෙන් ඉවත් කිරීම පමණක් කළ යුතුය.

(ඈ) පරිසර වශයෙන් සංවේදී කලාපයක පිහිටා ඇති බැවින්, ආරක්ෂා කර ගැනීම සඳහා අදාල රාජ්‍ය ආයතන වෙත පැවරිය යුතුය.

<u>කොන්දේසි</u>

I. මෙම ඉඩමෙන් වෙන්කල යුතු රක්ෂිත සීමා /සංරක්ෂිත බිම් වෙතොත් පහත සඳහන් කරන්න.

අ. ........................................................................................................

ආ. ........................................................................................................

ඇ. ........................................................................................................

II. ........................................................................................................

III. ........................................................................................................

ඉහත සඳහන් නිර්දේශ සහ කොන්දේසි වලට එකඟ වෙමු.

| ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී/ගොවිජන සංවර්ධන නිලධාරී | ඉංජිනේරු සහකාර/ කාර්මික නිලධාරී | කෘෂිකර්ම උපදේශක |
|---|---|---|
| නම : | නම : | නම : |
| නිල මුද්‍රාව: | නිල මුද්‍රාව: | නිල මුද්‍රාව: |
| දිනය : | දිනය : | දිනය : |

**11)** ගොවිජන සේවා කාරක සභාවේ නිර්දේශය

(අ) මෙම පුරන් කුඹුර සම්බන්ධයෙන් ඉහත සඳහන් නිර්දේශ පිළිගන්නා බව.

(ආ) මෙම පුරන් කුඹුරු සම්බන්ධයෙන් ඉහත සඳහන් නිර්දේශ පිළිනොගන්නා අතර, ඒ වෙනුවට පහත සඳහන් විකල්ප යෝජනා ඉදිරිපත් කරන බව,

.............................................. දින පැවති ගොවිජන සේවා කාරක සභා රැස්වීමේ දී තීරණය කරන ලදී.

<u>විකල්ප යෝජනා</u>

(I) ........................................................................................................

(ii) ........................................................................................................

(iii) ........................................................................................................

දිනය :

විධායක ලේකම්
නිල මුද්‍රාව

12) * වාරි මාර්ග /පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශය (අනවශ්‍ය පද කපා හරින්න.)

I. ඉහත සඳහන් නිර්දේශ වලට එකඟ වෙමි.

II. පහත සඳහන් හේතු මත, ඉහත සඳහන් නිර්දේශ වලට එකඟ විය නොහැකි බව සඳහන් කරමි.

(අ) ....................................................................................................

(ආ) ....................................................................................................

(ඇ) ....................................................................................................

විශේෂ යෝජනා.

....................................................................................................

....................................................................................................

....................................................................................................

දිනය :

වාරිමාර්ග ඉංජිනේරු/පළාත් වාරිමාර්ග ඉංජිනේරු

නිල මුද්‍රාව

* මෙම ඉඩම මහා වාරිමාර්ග/ විශේෂ වාරිමාර්ග බල ප්‍රදේශයක පිහිටා තිබේ නම් පමණක් මෙම කොටස පිරවිය යුතුය.

ඇමුණුම : 3

## "C" ඛණ්ඩයේ පුරන් කුඹුරු පිළිබඳ නිරදේශ ඇතුලත් ගොවිජන සේවා කාරක සභා මට්ටමේ සාරාංශය

දිස්ත්‍රික්කය : අංක ☐☐

ගොවිජන සේවා බල ප්‍රදේශය : අංක ☐☐

*නිර්දේශය
1 - තවදුරටත් කුඹුරක් ලෙස පවත්වා ගෙන යැමට උත්සාහ කළ යුතුය.
2 - කුඹුරු ඉඩමක් ලෙස පවත්වා ගෙන යැම ප්‍රායෝගික නොවන බැවින් ගොඩ ඉඩම් නාම ලේඛණයට ඇතුලත් කිරීම සුදුසු ය.
3 - කුඹුරු ඉඩමක් ලෙස හෝ කෘෂිකාර්මික ගොඩ ඉඩමක් ලෙස පවත්වා ගෙන යා නොහැකි බැවින්, කුඹුරු ඉඩම් නාම ලේඛනයෙන් ඉවත් කළ යුතුය.
4 - පරිසර වශයෙන් සංවේදී කලාපයක පිහිටා ඇති බැවින්, ආරක්ෂා කර ගැනීම සඳහා අදාළ රාජ්‍ය ආයතන වෙත පවරාදීම සුදුසුය.

| අනු අංකය | ඉඩමේ නම | අයිතිකරුගේ නම | ග්‍රා.නි. කොට්ඨාශ අංකය | යාය අංකය | හඳුනා ගැනීමේ අංකය | බිම් ප්‍රමාණය | | | කුඹුරු නාම ලේඛණයේ යොමුව | | | *නිර්දේශය (1,2,3,4) | කොන්දේසි ඉදිරිපත් කර ඇත/ නැත | ගොවිජන සේවා කාරක සභාව විසින් නිර්දේශ කර ඇත/නැත | [illegible] |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අක් | රූ | පර් | පොත් අංකය | පිටු අංකය | තීරු අංකය | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |

ඉහත සඳහන් ඉඩම් කුඹුරු නාම ලේඛණයේ "C" ඛණ්ඩයේ පුරන් කුඹුරු ලෙස හඳුනා ගෙන ඇති අතර,ඒ සම්බන්ධයෙන් වන නිර්දේශ පිළිබඳ සාරාංශය ඉහත සඳහන් වේ..

දිනය:-

.................................................
ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි
නිල මුද්‍රාව

| ආකෘති අංකය | DAD | PLR | 2018 | 02 |
|---|---|---|---|---|

ඇමුණුම - 4

<u>"C" බාණ්ඩයේ පුරන් කුඹුරු පිළිබඳ තීරණය ඇතුලත් දිස්ත්‍රික් සාරාංශය</u>

දිස්ත්‍රික්කය :

| අනු අංකය | ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය | ගොවිජන සේවා මධ්‍යස්ථානයේ අංකය | නිර්දේශය 1 | | | | නිර්දේශය 2 | | | | නිර්දේශය 3 | | | | නිර්දේශය 4 | | | | එකතුව | | | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | බිම් ප්‍රමාණය | | | කැබලි ප්‍රමාණය | බිම් ප්‍රමාණය | | | කැබලි ප්‍රමාණය | බිම් ප්‍රමාණය | | | කැබලි ප්‍රමාණය | බිම් ප්‍රමාණය | | | කැබලි ප්‍රමාණය | බිම් ප්‍රමාණය | | | කැබලි ප්‍රමාණය | |
| | | | අ | රූ | ප | | අ | රූ | ප | | අ | රූ | ප | | අ | රූ | ප | | අ | රූ | ප | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

දිනය:

.................................................................

ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්

නිලමුද්‍රාව